# පුස්තකාල ප්‍රවෘත්ති

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය

LIBRARY NEWS நூலகச் செய்தி

අපේ නව ලිපිනය

අධ්‍යක්ෂ,
ජාතික පුස්තකාල සේවා මණ්ඩලය
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල ගොඩනැගිල්ල,
නිදහස් මාවත,
කොළඹ 7. වැලි: 98847

● දෙවන කාණ්ඩය ● අංක: 1 ● VOLUME: 2 NO: 1


## පුස්තකාල නීතියේ අවශ්‍යතාවයක් කළ යුතුයි!

ශ්‍රී ලංකාවේ ගැමි ප්‍රදේශවලට වඩා හොඳ පුස්තකාල සේවයක් ලබා දීම සඳහා පළාත් පාලන ආයතනවලට හැකිවන පරිදි ජල පහසුකම් සෞඛ්‍ය පහසුකම්, ගමනා ගමන පහසුකම් යනාදී සේවා මෙන්ම, කියවීමේ පහසුකම් සැපයීම සඳහා පුස්තකාල සේවාව නීතියේ අවශ්‍යතාවයක් කිරීම ඉතා අත්‍යවශ්‍ය යැයි දිස්ත්‍රික් පුස්තකාල සංවර්ධන සම්මන්ත්‍රණය අමතා කතා කළ ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපති ඇම්. ජේ. පෙරේරා මහතා ප්‍රකාශ කළේය.

මෙහිදී වැඩිදුරටත් කතා කළ ඇම්. ජේ. පෙරේරා මහතා පළාත් පාලන ආයතන විසින් පුස්තකාල සේවා පවත්වනු ලබන්නේ වෙනත් සේවාවලට මුදල් වෙන් කිරීමෙන් පසු ඉතිරිවන මුදල් ප්‍රමාණය අනුව බව පෙන්වා දුන්නේය. මේ නිසා ඇතැම් ප්‍රදේශවල කොහෙත්ම කියවීමේ පහසුකම් නොමැති අතර බොහෝ ප්‍රදේශවල ඇත්තේ පොත් අල්මාරියකට හා ප්‍රවෘත්ති පත්‍ර කිහිපයකට සීමා වූ ''පුස්තකාල'' වශයෙන් හඳුන්වන කියවීම් ශාලා පමණක් බවද සඳහන් කළේය.

මනාව සංවිධානය වූ පුස්තකාලයකින් ගෝචර ප්‍රදේශයේ බාල, මහළු, විවිධ අධ්‍යාපනික සමාජ මට්ටමේ සියළු දෙනාටම සිය දැනුම හා තොරතුරු ලබා ගැනීම සඳහා පහසුකම් ලැබිය යුතු යැයිද ඔහු කියා සිටියේය.

මණ්ඩලය විසින් දිස්ත්‍රික්ක මට්ටමින් ප්‍රධාන පුස්තකාල පද්ධතියක් ඇති කිරීම සඳහා අවශ්‍ය ආධාර උපකාර ලබා දීමටත්, එවැනි පුස්තකාල සංවිධානය කර දීමටත් කටයුතු කරන්නේ මේ නිසා යැයිද පෙරේරා මහතා ප්‍රකාශ කළේය.

මෙම ව්‍යාපාරය ඉතා ඉක්මනින්ම ක්‍රියාත්මක කිරීමට තමා අදහස් කරන අතර, ඒ ඒ දිස්ත්‍රික්කවල පුස්තකාල සේවාවලට අවශ්‍ය උපදේශ හා ආධාර ලබා ගැනීමට පහසු කරවීම සඳහා දිවයිනේ විවිධ පළාත්වල පුස්තකාල සේවා මණ්ඩලයේ ශාඛා කාර්යාල පිහිටුවීමට සැලසුම් කර ඇති බවද ඔහු සඳහන් කළේය.

මෙම ප්‍රාදේශීය මධ්‍යස්ථාන මගින් අදාල දිස්ත්‍රික්කවල ඒකාබද්ධ පුස්තකාල සේවයක් ඇති කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට පුස්තකාල සේවා මණ්ඩලය බලාපොරොත්තුවන බවද ඔහු විසින් දක්වන්නට යෙදිණි.

# තවමත් පුස්තකාල සේවාව

# නීතියෙන් නොපිළිගැනේ

දිවයිනේ මහජන පුස්තකාල සේවාව තවමත් පවතින්නේ පළාත් පාලන ආයතනයන්හි නීතිමය වශයෙන් ඉටු කිරීමට පවරා ඇති සෞඛ්‍ය, ජල - විදුලිය, මංමාවත් වැනි අත්‍යවශ්‍ය සේවාවලින් පසුව ''ඉඩ හරින ලද'' සේවාවක් වශයෙන් බවද, පුස්තකාල සේවාව පිළිබඳවද එබඳු ව්‍යවස්ථා පැනවීමක් ඉතාමත් අත්‍යාවශ්‍ය යයිද, එය සේවාව ඇරඹීමට පෙරාතුව තිබිය යුතු මූලික අවශ්‍යතාවයක් සපුරාලීමක් යයිද නොබෝද ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පැවති දිස්ත්‍රික් පුස්තකාලයාධිපතීන්ගේ සම්මන්ත්‍රණයේදී දිවයිනේ ප්‍රමුඛ පුස්තකාලයාධිකාරීන් විසින් එකහෙළා ප්‍රකාශ කරන්නට යෙදුණි.

මේ නිසා මහජන පුස්තකල සේවාව පිළිබඳව කිසිම සංවර්ධන වැඩ පිළිවෙලක් වුවද නිසියාකාරව ක්‍රියාත්මක කිරීම මෙම ව්‍යවස්ථාමය පිළිගැනීම රහිතව සාර්ථක කිරීම අපහසු බවද ඔවුන් විසින් පෙන්වා දෙන ලදී.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් ආසියා පදනමේ අනුග්‍රහය ඇතිව දෙසතියක් මුළුල්ලේ ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පැවති මෙම දිස්ත්‍රික් පුස්තකාලයාධිපතීන්ගේ සම්මන්ත්‍රණය හා පාඨමාලාව විවෘත කරන ලද්දේ අධ්‍යාපන සේවා අමාත්‍ය ලයනල් ජයතිලක මැතිතුමා විසිනි.

ශ්‍රී ලංකාවේ ඇති සියළුම දිස්ත්‍රික්කවල ප්‍රධාන මහජන පුස්තකාල සංවර්ධනය කර ලිමටත් ඒවා කේන්ද්‍රිය කොට ගෙන ඒ වටා ඇති කුඩා පුස්තකාල සංවර්ධනය කිරීමේත් පළමු පියවර වශයෙන් මෙම පාඨමාලාව සංවිධානය කරන්නට යෙදුනි.

සියල්ලටම ප්‍රධාන වශයෙන් මහජන පුස්තකාල ආඥා පණතක් පැනවීම වැදගත් වනුයේ මහජන පුස්තකාල සේවාව ක්‍රමවත් බවට පත් කරලීමට මෙන්ම මහජන පුස්තකාල සංවර්ධනයේදී එය පරිසමාප්ත සේවාවක් වශයෙන් ජාතික මට්ටමින් සංවිධානය කිරීම උදෙසාද පහත සඳහන් යෝජනාව මෙම සම්මන්ත්‍රණයට හා පාඨමාලාවට සහභාගී වූවන් විසින් ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලදී.

''1981 මාර්තු මස නවවන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පැවැත්වුනු

(8 වන පිටුව බලන්න)




● නොබෝද කොළඹ ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පැවති දිස්ත්‍රික් පුස්තකාලයාධිපතීන්ගේ සම්මන්ත්‍රණය හා පාඨමාලාව අධ්‍යාපන සේවා අමාත්‍ය ලයනල් ජයතිලක මැතිතුමා විසින් චාරිත්‍රානුකූලව විවෘත කරන ලද අවස්ථාව. ඡායාරූපයේ වමේ සිට දකුණට ජාතික පුස්තකාල සේවා අධ්‍යක්ෂ එන්. අමරසිංහ, ආසියා පදනමේ දේශීය නියෝජිත ෆ්‍රැන්ක් ඊ. ඩයින්ස්, ගරු අමාත්‍යතුමා සහ පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපති එම්. ජේ. පෙරේරා යන මහත්වරු වෙති.

= ඡායාරූපය: ඩී. ගලප්පත්ති

# ශ්‍රී ලංකාවට ජාතික පුස්තකාලයක් අවශ්‍ය ඇයි?

**එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අංශයක් වන අධ්‍යාපන, විද්‍යාව සහ සංස්කෘතිය සම්බන්ධව කටයුතු කරන පැරිසියේ යුනෙස්කෝව, ලංකාවේ ජාතික පුස්තකාලය සැලසුම් කිරීමේ කටයුතුවලට උපදෙස් දීමට ලංකාවට පැමිණීමට කැමතිදැයි මගෙන් විමසූ විට මම එක විටම එයට එකඟ වූයෙමි. වසර ගණනාවක් මෙහි වාසය කිරීමෙන් දිවයින පිළිබඳව මා තුළ තිබූ සුහද හැඟීම එක විටම එයට එකඟ වීමට බල පෑ පෞද්ගලික හේතුව වූ අතර, මෙය ඉතාමත් වැදගත් අවශ්‍යතාවයක් ලෙස මා තුළ කාලයක් තිස්සේ බලපැවැත්වූ හැඟීම්ද, ඒ සඳහා බල පෑ තවත් කරුණක් ලෙස දැක්විය හැකියි.**



කොළඹ නිදහස් අනුස්මරණ මන්දිරය අසල පිහිටි පැරණි තුරඟ තරඟ පිට්ටියේ ඉදි කිරීම් කටයුතු අවසානවෙමින් පවත්නා ශ්‍රී ලංකා ජාතික පුස්තකාල ගොඩනැගිල්ල. ඡායා: ඩී. ගලප්පත්ති

කොළඹ ගමන ගැන සඳහන් කළ විට, මගේ මිත්‍රයින් ඒ පිළිබඳව ප්‍රශ්න රාශියක් නැඟීම මගේ ජීවිතයට හේතු වූ කරුණක් වූ බව සඳහන් කළ යුතුය. ලංකාවට පැමිණි පසුවත් ඒ පිළිබඳව මගෙන් විමසන ලදී. විවිධ ප්‍රශ්න පැන නැගුනත් ප්‍රශ්න කෙරෙහි ඇති ආකල්පය එතරම් විවිධ නොවන බව මම විශ්වාස කරමි. මෙම ප්‍රශ්න කුමන ඒවාදැයි දැක්වීමටත්, ඒ සඳහා මගේ පිළිතුරු ඉදිරිපත් කිරීමට උත්සාහ කිරීමටත්, ඔබ දැන් මට අවස්ථාව ලබා දිය යුතුය.


## අවශ්‍යතාව

සම්පූර්ණයෙන් අනාපේක්ෂිත නොවූ පළමු ප්‍රශ්නය නම් ඇත්ත වශයෙන්ම ජාතික පුස්තකාලයක අවශ්‍යතාවයක් තිබේද යන්නයි. විශේෂයෙන්ම බැරෑරුම් ප්‍රශ්න රාශියකට මුහුණ පා සිටින සංවර්ධනය වන රටකට එහි ඇති අවශ්‍යතාවය විමසුමට භාජනය වූ ප්‍රධාන ප්‍රශ්නයක් විය. මේ සඳහා මගේ පිළිතුර නම් විශේෂයෙන්ම සංවර්ධනය වන රටකට ජාතික පුස්තකාලයක් අවශ්‍ය බවයි.

ඕනෑම යුගයක විශේෂයෙන්ම වේගවත් සමාජයීය සහ ආර්ථික විපර්යාසයනුත් ඇතිවන වර්තමාන යුගයේ ඉතිහාසය හා සංස්කෘතිය චාරිත්‍ර ගතකොට තබා අනාගතය සඳහා ආරක්ෂා කර තැබීම ඉතාම වැදගත් දෙයක් වෙයි. මේ අන්දමට අප ක්‍රියා නොකළහොත් අපි අතීතය පමණක් නොව වර්තමානයද අතරමං කරනවා පමණක් නොව, අනාගතයේ ඇතිවන ජනතාවට තමන්ගේ ඉතිහාසය අවබෝධ කර ගැනීමේ හැකියාවක් ද අහිමි කරවනු ලබයි. මට පෙනෙන ආකාරයට ඕනෑම රටක ආර්ථික ප්‍රශ්නය තරම්ම වැදගත් වන මේ ප්‍රශ්නයේදී එයට සුළු අවධානයක් පමණක් යොමු කිරීම සාපරාධී වරදක් ලෙස සැලකිය යුතු දෙයකි.

කිසිම රටක ඇත්ත වශයෙන්ම එහි ආර්ථික අංශය මත පමණක්ම රඳා නොසිටින බව අප අමතක නොකළ යුතු දෙයකි. මේ නිසා විශේෂයෙන්ම සංස්කෘතික වශයෙන් ඉතාම දියුණු ලංකාව වැනි රටක මෙවැනි ආයතන පිහිටුවීම, අපි අපගේ අනාගත ඉතිහාසය සඳහා වඩා විශාල මෙහෙයක් කිරීමක් වේ.

මෙම තේමාවෙහිම තරමක් වෙනස් ස්වරූපයකින් ඉදිරිපත් වන දෙවන ප්‍රශ්නය බොහෝ දුරට එක හා සමාන ස්වරූපයක් දරනු ලබයි. ඒ අනුව ජාතික පුස්තකාලයක් සංවර්ධනය වන රටකට අවශ්‍ය බව පිළිගන්නා නමුත් මේ අවස්ථාවේ ඒ සඳහා දැරීමට සිදුවන අති විශාල වියදම, ගොඩනැගිලි තැනීම සඳහා මෙන්ම ඒ සමඟ බැඳී පවතින කාර්‍ය සංවිධානය සඳහා දැරීමට සිදුවන මුදලත් ඇත්ත වශයෙන්, වෙනත් අංශයක වඩා විශාල අවශ්‍යතාවයක් සඳහා නොයෙදවිය යුතුද යන්න මත වේ.



පුස්තකාල ගොඩනැගිලි පිළිබඳ යුනෙස්කෝ විශේෂඥ

මහාචාර්ය

**මයිකල් බ්‍රෝන්**

විසිනි

නැවතත් මේ පිළිබඳව මගේ අදහස් ප්‍රකාශ කිරීමට ඉඩ දෙනු මැනවි. මට පෙනෙන ආකාරයට නම් යමෙකු ආර්ථිකය ගැන කථා කරනවා නම්, ඔහු සම්පූර්ණයෙන්ම මුදල් ගැන පමණක් කතා කරන බවයි. සරල වශයෙන් කියනවා නම් ඔහු 'දරිද්‍රතාවය' ගැන පමණක් කතා කරනු බවයි. නමුත් මගේ අදහසේ හැටියට 'දරිද්‍රතාවය' යනු මුදල් පිළිබඳ කරුණක් පමණක් නොවන බව, සංවර්ධිත රටවල් සම්බන්ධයෙන් මෙන්ම සංවර්ධනය වන්නා වූ රටවල් සම්බන්ධයෙන්ද මීට කලකට පෙර අප සොයා ගන්නා ලද කරුණකි. එය සම්පත් පාලනය කිරීම පිළිබඳ කරුණක් වන අතර, සම්පත් ලෙස හැඳින් වෙන්නේ ආර්ථිකය හා මුදල් පමණක් නොව ඊට වඩා විශාල ක්ෂේත්‍රයකි.

විසිවන සියවසේ පශ්චාත් භාගයේදී ප්‍රවෘත්ති විශාල සම්පතක් බවත්, එය මුදල් තරම්ම වැදගත් වන්නක් බවත් කවුරුත් දන්නා කරුණකි. එසේම එය මුල පටන්ම වැදගත් සම්පතක් ලෙස පැවතුණු බවත්, සඳහන් කිරීමට කැමැත්තෙමි. වෙනත් සමාජයන්හි උගත්කම, පාලනය ලබා ගැනීමේ ප්‍රබල මාර්ගයක් වන අතර, තොරතුරු හොඳින් යොදා ගැනීමේ සාමාන්‍ය හැකියාව නිසාම ජන කොටස් සහ ජාතීන්ට පාලනය ලබා ගැනීමට හැකියාව ලැබී තිබේ.

මෑතක දී සිදු වූ දෙයක් ගැන බලන විට නෞකා ශිල්පය, කොම්පාසුව සහ වෙඩි බෙහෙත් පිළිබඳව දැන ගත් සමහර ජාතීන්ට විජිත ආධිපත්‍යයන්, ලෝකය පුරා අති විශාල ධන සම්පතුත් අත්පත් කර ගත හැකි වීම දැක්වීමට පිළිවන. මම අදහස් කරන අන්දමට වර්තමානයේදී අප මුහුණ පා සිටින තත්ත්වයත් මීට සමානය. මට පෙනෙන ආකාරයට අද ඇති විශාල තොරතුරු නිධානවලට ඇත්ත වශයෙන්ම සම්බන්ධකමක් පවත්වා නොගන්නා කිසිම ජාතියකට, මම මුලදී පෙන්නුම් කළ ආකාරයට සංස්කෘතික වශයෙන් පැවතීමට නොහැකි වෙනවා මෙන්ම, ආර්ථික වශයෙන් පැවතීමට ද නොහැකිව බලපෑම් සහගත තත්ත්වයෙන් ගිලිහී ගොස් ලෝකයේ, එයට අයිති ස්ථානයේ සිටිය නොහැකි තත්ත්වයක් උදා වේ.

## තොරතුරු ගබඩා

පුස්තකාල පිළිබඳ සම්පූර්ණ සංකල්පයේම මීට සම්බන්ධ තවත් අංශයක් ඇතැයි මම සිතමි. බ්‍රිතාන්‍යය, ඇමෙරිකාව සහ ලෝකයේ තවත් ප්‍රදේශවල විශාල තොරතුරු ගබඩා වැනි වූ පුස්තකාල තිබේ. ඔබට යම්කිසි තොරතුරක් දැන ගැනීම අවශ්‍ය වූ විට මෙවාට ගොස් පොත්, අත් පිටපත් නැතිනම් වෙනත් මාධ්‍යයක් ලබා ගැනීමට පුළුවන. වෙනත් අවස්ථාවල මෙම පුස්තකාල අධ්‍යාපනය පිළිබඳ දැනුම, එක් රැස් කර ගෙන සිටින ස්ථානවලට වඩා තොරතුරු බෙදා හරින මධ්‍යස්ථාන වශයෙන් ක්‍රියා කිරීමක් දක්නට ලැබේ. ඒ අනුව තොරතුරු ශ්‍රී ලංකාවෙන් හෝ ලෝකයේ කුමන රටකින් ලැබුණත්, මේ රටේ සියළුම ජනතාවට ලබා ගැනීමට හැකි වෙන අතර, ඒ මගින් ජනතාවට ලෝකයවටා සිදුවන දේවල් පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ඇතිව සිටිය හැකිවේ.

මගෙන් අසන ලද වඩාත් සිත්ගන්නා සුළු තුන්වන ප්‍රශ්නය වනුයේ විසිවන සියවසේ දෙවන භාගයේදී මුද්‍රිත අකුරුවලට වඩා වෙනත් මාධ්‍යයන්, වඩාත් ඉක්මන් වෙනත් ප්‍රචාරක මාධ්‍යයන් තිබියදී පොත් සහ පුස්තකාල අවශ්‍යද යන්නයි. මේ අනුව ශ්‍රී ලංකාවේ ටෙලිවිෂන් සේවාවක් ඇති කිරීමට හෝ ගුවන් විදුලි ප්‍රචාරක ක්‍රමය වඩා පුළුල් කිරීමට හෝ මුදල් යෙදවීම වඩා යෝග්‍ය නොවන්නේද යන්න පැන නැගී. එහි එක් අංශයක් සරල වුවත්, මෙවාට ඇති පිළිතුරු තරමක් සංකීර්ණ යැයි සිතමි. ටෙලිවිෂන් සේවාවක් පිහිටුවීම ජාතික පුස්තකාලයක් පිහිටුවනවාට වඩා ඉතා විශාල ලෙස වියදම් යන කාර්‍යයක් වන අතර, මේ අංශ දෙකට වැය වන මුදල් ප්‍රමාණය පිළිබඳව කිසිම ආකාරයක සැසඳීමක් කළ නොහැක. ඒ සමගම වඩා වැදගත් මූලික කරුණක් වේ. එකිනෙකට වෙනස් මාධ්‍යයන් විවිධ කාර්යයන් ඉටු කරනු ලැබිය යුතු වෙයි.

මුද්‍රිත ග්‍රන්ථයක් හෝ මුද්‍රණය කරන ලද ද්‍රව්‍යයක ඇති විශාලම වාසි සහගත

[7 පිටුව බලන්න]

# පුස්තකාල විද්‍යා පාඨමාලා විමර්ශනය කෙරේ

ලංකාවේ විවිධ අධ්‍යාපනික හා වෘත්තීය ආයතනවලින් පවත්වාගෙන යනු ලබන පුස්තකාල විද්‍යා පාඨමාලාවල වෘත්තීයමය තත්වය ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ පරීක්ෂණයට භාජනය වී ඇත.

පුස්තකාල විද්‍යා පාඨමාලා විමර්ශණයට ලක් කිරීම සඳහා පත්කරන ලද විශේෂ කමිටුවක් විසින් දැනටමත් කැළණිය විශ්ව විද්‍යාලය විසින් පවත්වාගෙන යනු ලබන පුස්තකාල විද්‍යා සහතික පත්‍ර පාඨ මාලාව පිළිබඳ සිය වාර්තාව මණ්ඩලයට ඉදිරිපත් කොට තිබේ.

දැනට අවුරුදු කීපයක සිට පුස්තකාල විද්‍යා පාඨ මාලා හදුරා පුස්තකාල ක්ෂෙත්‍රයට පිවිසෙන පුස්තාලයාධිපතීන්ගේ වෘත්තීය දැනුම හා දක්ෂතා පිළිබඳව විවිධ දෙපාර්තමේන්තු ආයතන හා ප්‍රධාන පුස්තකාලයාධිපතිවරුන් විසින් සිය අපේක්ෂා භංගත්වය පළකොට මණ්ඩලයට කරුණු ඉදිරිපත් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම පියවර ගෙන ඇත.

ලංකාවේ පුස්තකාල විද්‍යා පාඨ මාලා පවත්වනු ලබන්නේ ශ්‍රී ලංකා පුස්තකාල සංගමය හා කැළණිය විශ්ව විද්‍යාලය මගිනි.

ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල පණතයටතේ පුස්තකාල විද්‍යා සහතික පත්‍ර පිළිගැනීම පිළිබඳව රජයට උපදෙස් දීම ජාතික පුස්තකාල සේවා මණ්ඩලයට පැවරී ඇති වග කීමකි.

## ඒ. ඩබ්. පෙරේරා ලිපි ජාතික පුස්තකාලයේ තැන්පත් වේ

1915 ලංකාවේ පැවති සිංහල - මුස්ලිම් අරගලය හේතුකොට ගෙන ඇති වූ ජාතික සටන සම්බන්ධයෙන් එවකට ලංකාවේ විසූ ප්‍රමුඛ දෙශ ප්‍රේමියකු වූ ඒ. ඩබ්ලිව්. පෙරේරා මහතා විසින් බ්‍රිතාන්‍ය රජය විසින් මෙම අරගලය මර්දනය කිරීමේදී කරන ලද අසාධාරණකම් හා ලංකාවට ස්වාධීනත්වය ලබා ගැනීමේ අවශ්‍යතාවය දක්වමින් තමා විසින් එංගලන්තයේ හා ලංකාවේ ගෙන ගිය දේශපාලන ව්‍යාපාරයට සම්බන්ධව ලියුම් කියුම් රාශියක් ජාතික පුස්තකාලයට ලැබී තිබේ.

මෙම වටිනා ලේඛන තොගය ජාතික පුස්තකාලයට තෑගි කරන ලද්දේ මහාචාර්ය ඩී. ඒ. හෙට්ටිආරච්චි මහතා විසිනි.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුස්තකාලය ප්‍රතිසංවිධානයට විශේෂඥයෙක්

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුස්තකාලය ප්‍රතිසංවිධානය කිරීම සඳහා ඕස්ට්‍රේලියාවේCSIRO ආයතනයේ පුස්තකාලයාධිපති පීටර් රසල් මහතා ලංකාවට පැමිණ සිටී. පීටර් රසල් මහතා ඕස්ට්‍රේලියාවේ විශාලතම විශේෂ පුස්තකාලයේ පුස්තකාලයාධිපතිවරයාය.

ලංකාවේ කෘෂිකර්ම හා තදසත්ත විෂයයන් පිළිබඳ ඉතාම විශාල පුස්තකාලය වන පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තු පුස්තකාලය පර්යේෂණ පුස්තකාලයක් වශයෙන් සංවිධානය කළයුතු බව ජාතික පුස්තකාල මණ්ඩලය විසින් කරන ලද පරීක්ෂණයකින් පසු එහි අධ්‍යක්ෂවරයාට උපදෙස් දෙන ලදී. මේ සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කළ මණ්ඩලය පළපුරුදු පුස්තකාලයාධිපතිවරයකුගේ මාර්ගෝපදේශකත්වය යටතේ පුස්තකාල ප්‍රතිසංවිධානය කිරීමත්, දැනට ඇති කාර්ය මණ්ඩලය නූතන විශේෂ පුස්තකාල සේවා පිළිබඳ පුහුණුවක් ලබාදිය යුතු බවත් නිර්දේශ කරන ලදී.

පීටර් රසල් මහතා මේ සම්බන්ධයෙන් ජාතික පුස්තකාල සේවා මණ්ඩලය සමඟ සාකච්ඡා පවත්වන ලදී.

## ශ්‍රී ලංකාවේ වෛද්‍ය ප්‍රකාශන ග්‍රන්ථ නාමාවලියක්

ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභාවේ සමාජ විද්‍යා පර්යේෂණ මධ්‍යස්ථානය මගින් ශ්‍රී ලංකාවේ මෙන්ම, විදේශයන්හිද ශ්‍රී ලංකාවේ වෛද්‍ය පර්යේෂණ අරභයා පළව ඇති ප්‍රකාශන පිළිබඳ ග්‍රන්ථ නාමාවලියක් තොබෝද ප්‍රකාශයට පත් කර ඇත.

කාමලිකා පීරිස් මහත්මිය සහ සී. ජේ. ඌරගොඩ විසින් සම්පාදනය කර ඇති මෙම ග්‍රන්ථ නාමාවලිය සංලේඛ 4,500 කින් සමන්විතය.

## ශ්‍රී ලංකා සිතියම් සූචියක්

නෙදර්ලන්තයේ හේග් නුවර පිහිටි රාජ්‍ය ලේඛනාගාරයේ ඇති ශ්‍රී ලංකා සිතියම් පිළිබඳ සූචියක් දැන් සැකසෙමින් පවතින බව වාර්තා වේ.

මෙම ලේඛනය ප්‍රාදේශීය නාම අනුව වර්ග කර දක්වා ඇත. එමෙන් 1796 සිට 1638 දක්වා පිළියෙල කළ සිතියම 302 ක පමණ විමර්ශන අඩංගු කර ඇති බව දක්වේ.


මෙම සූචිය සම්පාදනය කරනු ලබන්නේ ශ්‍රී ලංකා රාජ්‍ය ලේඛනාගාරයේ සහකාර ලේඛනාරක්ෂක කේ. ඩී. පරණවිතාන මහතා විසිනි.

## දිස්ත්‍රික් පුස්තකාලයාධිපතීන්ගේ සම්මන්ත්‍රණයේ ඡායාරූප වාර්තා


(ඩී. ගලප්පත්ති විසිනි)



දිස්ත්‍රික් පුස්තකාලයාධිපතීන් අමතා ජාතික පුස්තකාල සේවා අධ්‍යක්ෂ එන්. අමරසිංහ මහතා කතා කළ අවස්ථාවයි මේ. වේදිකාවේ අසුන්ගෙන සිටින්නේ (පිළිවෙලින් වමේ සිට) ආසියා පදනමේ දේශීය නියෝජිත ප්‍රැන්ක් ඒ. ඩයින්ස්, පළාත් පාලන සේවා අධ්‍යක්ෂ බී. ලියනමාන, අධ්‍යාපන සේවා අමාත්‍යාංශයේ ලේකම් චන්ද්‍රා ද සොයිසා, ශ්‍රී ලංකා පදනමේ අධ්‍යක්ෂ ආචාර්ය ඩී. වෙසුම්පෙරුම, පුස්තකාල සේවා මණ්ඩල සභාපති එම්. ජේ. පෙරේරා සහ අධ්‍යාපන සේවා අමාත්‍ය ගරු ලයනල් ජයතිලක යන මහත්වරුය.



ස්ත්‍රික් පුස්තකාල සම්මන්ත්‍රණය සංවිධානය භාරව කටයුතු කළ පුස්තකාල සේවා මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂ උපාලි අමරසිරි මහතා අධ්‍යාපන සේවා අමාත්‍යතුමාට පාඨමාලාවට අදළ කරුණක් විස්තර කර දෙයි.



දිස්ත්‍රික් පුස්තකාලයාධිපතීන්ගේ සම්මන්ත්‍රණයේ පසුබිම් දේශණය පළාත් පාලන සේවා අධ්‍යක්ෂ බී. ලියනමාන මහතා විසින් පවත්වන ලද අකාරය මෙහි දක්වෙයි. මුලසුනේ සිටින්නේ පුස්තකාල සේවා මණ්ඩල සභාපති එම්. ජේ. පෙරේරා මහතාය.

# දිස්ත්‍රික්ක පුස්තකාල සංවර්ධන සැලැස්ම

**● ජාතික මට්ටමින් මහජන පුස්තකාල සේවයක් ඇරඹීම සඳහා දිස්ත්‍රික්ක පුස්තකාල ක්‍රමයක් ඇරඹීමේ අවශ්‍යතාවය ගැන යෝජනා ඉදිරිපත් වූයේ දැනට අවුරුදු 20කටත් පෙරය.**

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ
පුස්තකාල සේවා පිළිබඳ සහකාර අධ්‍යක්ෂ
එස්. එම්. කමල්දීන්
විසිනි

**ඇත්ත වශයෙන්ම දිස්ත්‍රික් පුස්තකාල ක්‍රමයක් ගැන සලකා බලන ලද්දේ ලංකාවේ පැවති පළාත් පාලන ආයතන ක්‍රමය අනුව පළාත් පාලන ආයතන සංඛ්‍යාව ඉතා වැඩි බැවින් දිස්ත්‍රික්ක මට්ටමේ පළාත් පාලන ක්‍රමයක් ඇති විය යුතුය, යන අපේක්ෂාව මතය. දිස්ත්‍රික් මට්ටමේ පළාත් පාලන ආයතන ක්‍රමයක් 'දිස්ත්‍රික් සංවර්ධන මණ්ඩල' නමින් හඳුන්වන පළාත් පාලන ක්‍රමය යටතේ ඇති කිරීමට වර්තමාන රජය ක්‍රියා කිරීම සතුටට කරුණකි. අනිවාර්යයෙන්ම මේ නිසා දිස්ත්‍රික් මහජන පුස්තකාල ක්‍රමයක් ඇතිවීම නොවැළැක්විය හැක්කකි.**

දිස්ත්‍රික්කයක සංවර්ධන කටයුතු දිස්ත්‍රික් සංවර්ධන මණ්ඩලයේ විධායක කමිටුව විසින් මෙහෙයවීම රජයේ පරමාර්ථය වේ. එම සංවර්ධන මණ්ඩලයේ ප්‍රධානියා වන්නේ දිස්ත්‍රික් ඇමතිවරයාය. මෙම ක්‍රමය යටතේ දිස්ත්‍රික්කයේ සියළු දෙනාටම ප්‍රයෝජන ගත හැකි පුස්තකාල ක්‍රමයක් දිස්ත්‍රික් ඇමතිතුමා සහ සංවර්ධන මණ්ඩලය යටතේ බිහිවනු ඇත. එවැනි සංවිධානයක් මගින් දිස්ත්‍රික්කයේ ඇති පුස්තකාල පහසුකම් වලින් උපරිම ප්‍රයෝජනයක් මහජනයාට ලබා ගත හැකි වන අතර, පුස්තකාල ක්ෂේත්‍රයේ ඇති සීමිත සම්පත් වඩා හොඳින් ප්‍රයෝජනයට ගැනීමටද හැකිවනවා ඇත. දිස්ත්‍රික් සංවර්ධන ක්‍රමය යටතේ ඇති කාර්ය භාරයට පුස්තකාල සේවා ඇතුළත් නොවී ඇති බව මා මෙහිදී සඳහන් කළ යුතුයි. ඇතැම් විට අධ්‍යාපනික හා සංස්කෘතික කටයුතු අතරට පුස්තකාල සංවර්ධන කටයුතුද ඇතුළත්වේ යයි අනුමාන කළ හැක. දිස්ත්‍රික් සංවර්ධනය ක්‍රමය යටතේ අධ්‍යාපනික හා සංස්කෘතික කටයුතු සඳහන් වී තිබේ. ඒ හැර සිය වැඩ පිළිවෙලට ඇතුළත් නොවී ඇති ඕනෑම විෂයක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට අවකාශය දිස්ත්‍රික් සංවර්ධන මණ්ඩලයේ කාර්ය භාරයට ඇතුළත් වී තිබේ. එමනිසා පුස්තකාල සංවර්ධනය පිළිබඳව කටයුතු කෙරෙහි දිස්ත්‍රික් සංවර්ධන මණ්ඩලය අවධානය යොමු කරනු ඇතැයි විශ්වාස කළ හැක.

## කමිටු නිර්දේශ

1955 දී පමණ ඈත කාලයේ සිට ජාතික මට්ටමින් ඒකාබද්ධ පුස්තකාල සේවයක් ඇති කිරීමෙහිලා බලධාරීන් අවධානය යොමු කොට තිබේ. පළාත් පාලන ආයතනවල පුස්තකාල සම්බන්ධයෙන් නිර්දේශයක් කළ වෙ.ක්සි කොමිෂන් වාර්තාව මෙසේ සඳහන් කර තිබෙනවා. ''පුස්තකාල සම්බන්ධයෙන් අප අරමුණ විය යුත්තේ ඉතා කුඩා පළාත් පාලන ආයතනයකට අයත් ප්‍රදේශයක වෙසෙන මහජනයාට වුවද තමාගේ ශාස්ත්‍රීය කටයුතුවලට හෝ සාමාන්‍ය කියවීමට හෝ අවශ්‍ය වන පොත පත තම ගම්සභා පුස්තකාලයට ලබා ගැනීමට නොහැකි නම් වෙනත් පුස්තකාලයකින් අන්තර් පුස්තකාලයීය සහයෝගිතා ක්‍රමයක් යටතේ ලබා ගැනීමට පහසුකම් සැපයීමයි. (සැසි වාර්තා– 32. 1955 පළාත් පාලන ආණ්ඩු ක්‍රමය පිළිබඳ කොමිෂන් වාර්තාව 1958) කන්දයියා කොමිෂන් වාර්තාවේද මෙම අදහසම ප්‍රකාශ කොට තිබේ. එහි සඳහන් කොට ඇත්තේ ජාතික මට්ටමෙන් පුස්තකාල දියුණු කිරීම සඳහා ජාතික පුස්තකාලයක් අවශ්‍ය බවත්, ජාතික පුස්තකාලයේ මූලික සේවාවලට අමතර වශයෙන් දීප ව්‍යාප්තව පුස්තකාල සේවා සංවිධානය කිරීමේ මධ්‍යස්ථාන වශයෙන් ජාතික පුස්තකාලය කටයුතු කළයුතු බවත්ය. එවැනි මධ්‍යගත සේවයකින් පොත පත ගැන තොරතුරුද, පොත් පත් නොහොත් පුස්තකාල සංවිධාන කිරීමේ ක්‍රමයද සැලැස්විය යුතු වන්නේය. (කොළඹ මහජන පුස්තකාලය පිළිබඳ කොමිෂන් වාර්තාව 1958)

1961 දී ලංකාවට පැමිණි පුස්තකාල විශේෂඥ හැරල්ඩ් වී. බොනී විසින්ද 1967 දී කොළඹ පැවති ''ආසියාවේ පුස්තකාල සේවා සැලසුම් කිරීම පිළිබඳ විශේෂඥයින්ගේ සම්මේලනය'' විසින්ද දිස්ත්‍රික්ක මධ්‍ය පුස්තකාල ක්‍රමයක් පිහිටවිය යුතු බව ප්‍රකාශ කරන ලදී.

බොනී මහතා යෝජනා කරන ලද්දේ මහජන පුස්තකාල සේවා මණ්ඩලයක් ඇති කිරීමටත්, ඒ යටතේ දිස්ත්‍රික් පුස්තකාල සේවා දිස්ත්‍රික්ක පුස්තකාල සේවා මණ්ඩලද, මෙම දිස්ත්‍රික්ක පුස්තකාල සේවා මණ්ඩල මගින් ඒ ඒ දිස්ත්‍රික්කවල පුස්තකාල සංවිධානය කිරීමටත්ය.

## මණ්ඩලයේ කාර්ය

'අද තත්වය අනුව, ජාතික පුස්තකාල මණ්ඩලයක් පිහිටුවා ඇති හෙයින් දිස්ත්‍රික්ක පුස්තකාල කටයුතු සංවිධානය කිරීම හා සේවා ඒකාබද්ධ කිරීම මෙම මණ්ඩලයේ කාර්යයක් වීම ස්වභාවිකයි. ලංකාවේ පුස්තකාල සංවර්ධනය පිළිබඳව මධ්‍යම කාර්යාංශය වන්නේ ජාතික පුස්තකාල සේවා මණ්ඩලයයි.

1967 දී පැවැති පුස්තකාල විශේෂඥ සම්මේලනයේ අදහස වූයේද දිස්ත්‍රික්ක පදනමක් යටතේ මහජන පුස්තකාල සංවිධානයක් ඇති කිරීමය. දිස්ත්‍රික්ක පුස්තකාල සම්බන්ධයෙන් එම සම්මේලන වාර්තාවේ මෙසේ සඳහන් වේ.

''ලංකාවේ දිස්ත්‍රික්ක 22 ක් ඇත. මේ හැම දිස්ත්‍රික්කයකම ප්‍රධාන නගරයේ දිස්ත්‍රික්ක පුස්තකාලයක් පිහිටවනු ඇත. මෙම පුස්තකාලය භාරව කටයුතු කරන පුස්තකාලයාධිපතින් විසින් එම නගරවල පුස්තකාල සේවයක් ඇති කළ යුතු අතර, දිස්ත්‍රික්කයේ සෙසු ප්‍රදේශවලද පුස්තකාල පහසුකම් සංවර්ධනය කළ යුතු වේ.''


මෙම වාර්තාවේ නිර්දේශ කොට ඇත්තේ ජාතික මට්ටමින් පුස්තකාල සේවා සංවිධානය හා සැලසුම් කිරීම පිළිබඳ අධිකාරිය ලෙස ජාතික පුස්තකාල සේවා මණ්ඩලය ක්‍රියා කළ යුතු බවත්, ඒ මාර්ගයෙන් මහජන පුස්තකාල සේවාවන් ඒකාබද්ධ කළ යුතු බවත්ය. යථෝක්ත සම්මේලනයට ඉක්බිතිව ලංකාවට පැමිණි යුනෙස්කෝ විශේෂඥ එච් ලින් එවන්ස් මෙනෙවිය මෙම යෝජනා ප්‍රායෝගික වශයෙන් ක්‍රියාත්මක ආකාරයට රජයට පෙන්වා දුන්නාය.

## පණතක අවශ්‍යතාව

මේ අවස්ථාවේ මම සඳහන් කරන්නට කැමතියි, ලංකාවේ මහජන පුස්තකාල සංවර්ධනය කිරීමෙහි ලා බොහෝ කාලයක සිට පැවත එන දුෂ්කරතාවයන් දෙකක් ගැන. එනම්, පුස්තකාල සේවාවලට අදාළව රාජ්‍ය පණතක් නොතිබීමත්, මහජන පුස්තකාල පැවැත්වීම/ නොපැවැත්වීම පළාත් පාලන අධිකාරීන්ගේ අභිමතය පරිදි කළ හැක්කක් වීමත්ය. එනිසා ජාතික මට්ටමේ පුස්තකාල සේවයක් ඇති කිරීම සඳහා මහජන පුස්තකාල පණතක ඇති අවශ්‍යතාවයත්, එවැනි පණතක් යටතේ පළාත් පාලන ආයතන මගින් පැවැත්වීම නීතිමය අවශ්‍යතාවයක් කිරීමත් ඉතාම කළ යුත්තකි.

මේ සම්බන්ධයෙන් අපේ අසල්වැසි රටක් වන ඉන්දියාවේ මද්‍රාසි ප්‍රාන්තයේ 1948 දී ඇති කළ මහජන පුස්තකාල පණත අප කාගේත් සැලකිල්ලට භාජන විය යුත්තකි. පසුගිය විසිපස් වසර තුළ මද්‍රාසි ප්‍රාන්තයේ ක්‍රමවත් මහජන පුස්තකාලයක් ගොඩ නැගීමට මෙම පණත ඉතාමත් ප්‍රයෝජනවත් වී ඇත.

ලංකාවේ මහජන පුස්තකාල සේවයක් ප්‍රතිෂ්ඨාපනය නොවීමට හේතු වූයේ අප බ්‍රිතාන්‍ය පුස්තකාල සේවා අනුගමනය කිරීම නිසාය. බ්‍රිතාන්‍යයේ පවා 1850 ට පසු මහජන පුස්තකාල සේවා පැවැත්වීම සඳහා නීතිරීති ඇතිවිය. 1964 දී එක්සත් රාජධානියේ සම්මත වූ පුස්තකාල හා කෞතුකාගාර ආඥා පණත යටතේ පළාත් පාලන ආයතන විසින් පුස්තකාල සේවා ආරම්භ කිරීමට අවශ්‍ය සේවාවක් කරන ලදී. එම පණතේ විධි විධානයන්ට අනුව එංගලන්තයේ හා වේල්සයේ පුස්තකාල සේවා පැවැත්වීම අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ රාජ්‍ය ලේකම්වරයාගේ වගකීමක් විය.




දිස්ත්‍රික් පුස්තකාල සැලැස්ම සහ ජාතික පුස්තකාලය හා එය අනුබද්ධ වන ආකාරය ඉහත සටහනෙන් දැක්වේ.

මා කලින් සඳහන් කළ පරිදි කන්දයියා කොමිෂන් වාර්තාවේත්, 1967 පුස්තකාල විශේෂඥවරුන්ගේ සම්මේලන වාර්තාවේත් නිර්දේශ කොට ඇති අයුරු අනාගතයේදී ලංකාවේ ඒකාබද්ධ මහජන පුස්තකාල සේවයක් සංවිධානය කිරීම සඳහා සකස් කෙරෙන ආඥා පණතක ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ පුස්තකාල සේවා අංශය එම සේවා සංවිධානයේ කේන්ද්‍රස්ථානය ලෙස පිළිගැනීම අවශ්‍යයයි සිතමි.

කුමන රටක වුවත්, ක්‍රමවත් පුස්තකාල සේවයක් සංවිධානය කිරීමේදී පළාත් පාලන ආයතනවල සංඛ්‍යාව, ස්වභාවය ගැන සැලකිලිමත් වීම ඉතා වැදගත් කාරණකි. උදාහරණයක් වශයෙන්, එංගලන්තයේ 1972 දී ඇති කළ පළාත්පාලන ආයතන පණතින් එම රටෙහි තිබූ පළාත් පාලන ආයතන සංඛ්‍යාව 364 සිට 107 දක්වා අඩු කරනු ලැබිය. මෙසේ පළාත් පාලන ආයතන සංඛ්‍යාව අඩු කිරීම හේතු කොට ගෙන පළාත් පාලන ආයතන වඩාත් ප්‍රබල වී, වඩාත් පළල් සේවා ඇති කිරීමට සමත් විය. පුස්තකාල සේවා පැවැත්වීම සඳහා මේ අනුව පළාත් පාලන ආයතන සංඛ්‍යාව කුඩා විය. එසේම ඒ ආයතනවලට සැලකිය යුතු ප්‍රමාණයේ ජනගහනයකට එම සේවා ලබා දීමට හැකි විය. ඒ සඳහා ලැබූ මුදල් ප්‍රමාණයද වැඩි විය. ඒ නිසා විශාල ප්‍රදේශයක පුස්තකාල පහසුකම් සැපයීමටද හැකි විය. එහි ප්‍රතිඵලය වූයේ 1964 පුස්තකාල හා කෞතුකාගාර ආඥා පණත අනුව විධිමත් වූද ව්‍යාප්ත වූද සේවාවන් ඇති කිරීමට හැකි වීමය.

ලංකාවේද දැන් මෙවැනි ප්‍රතිසංවිධානයකින් පළාත් පාලන ආයතන වඩා ක්‍රියාශීලි ආයතන බවට පත් කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ. දැනට 679 ක් වන පළාත් ආණ්ඩු ආයතන සංඛ්‍යාව 250 දක්වා අඩු කිරීමට යෝජනා කොට ඇත. මුදල් තත්ත්වය අසතුටුදායක, අවශ්‍ය පුහුණු සේවක මණ්ඩලය නොමැති දුර්වල පළාත් පාලන ආයතන වෙනුවට ශක්තිමත් පළාත් පාලන ක්‍රමයක් මෙයින් අනිවාර්යයෙන් ඇති වීම බලාපොරොත්තු විය හැක. ඒ අනුව පුස්තකාල සේවාද වඩා ක්‍රියාශීලි සේවයක් වනු නොඅනුමානය.

මේතෙක් පැවති පළාත් පාලන ආයතන ක්‍රමය යටතේ පුස්තකාල සේවාවල තත්ත්වය ගැන යුනෙස්කෝ විශේෂඥ සමුද්‍රවේ වාර්තාවේ සඳහන් කළ කරුණු ගැන අවධානය යොමු කිරීම මෙහිදී අවස්ථානුකූල බව පෙනේ. එහි මෙසේ සඳහන් වේ.

''කිසිම මහජන පුස්තකාලයකට පොත්පත් ගැනීම සඳහා අවශ්‍ය ප්‍රමාණයේ මුදල් නොමැත... විශාල පුස්තකාල කීපයක හැරෙන විට සෙසු පුස්තකාලවලට අවශ්‍ය පුහුණු කාර්ය මණ්ඩලයක්ද නැත.''

''බොහෝ පුස්තකාලවලට සේවා මට්ටම නිර්ණය කොට නැත. ළමා සේවයක් ඇත්තේ ඉතා කලාතුරකිනි. බොහෝ පුස්තකාලවල විශාලම ඉඩ ප්‍රමාණයක් වෙන් කොට ඇත්තේ ප්‍රවෘත්ති පත්‍ර හා සඟරා කියවීමටය.''

## කියවීම් ශාලා

දැයින්, විශේෂයෙන්ම ගම්බද පළාත්වල පුස්තකාලවල කැපී පෙනෙන ලක්ෂණය වන්නේ, ඉතා නොදියුණු තත්ත්වයයි. මෙම අවාසනා තත්ත්වයට හේතුව කුමක්ද යන්න සොයා ගැනීම ඉතාම පහසුයි. මා කලින් සඳහන් කළ පරිදි පුස්තකාල සේවය අත්‍යවශ්‍ය සේවයක් ලෙස නොසැලකීම නිස ඊට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලැබෙන්නේ නැ. මීටත් වැඩිය දැනට ඇති ක්‍රමය අනුව පළාත් පාලන ආයතනවලට ශක්තියක් නැ විධිමත් පුස්තකාල සේවයක් පවත්වාගෙන යෑමට. පුස්තකාල සේවයක්ය කියා හඳුන්වන්නේ ඇත්ත වශයෙන්ම ප්‍රවෘත්ති පත්‍ර කියවීම සඳහා ඇති ශාලාවකටය.

1979 පුස්තකාල සේවා මණ්ඩලය විසින් දීපව්‍යාප්ත පුස්තකාල සමීක්ෂණයක් කරන ලද්දේ මේ තත්ත්වය යටතේය. මෙහි මූලික අරමුණ වූයේ මහජන පුස්තකාල ශ්‍රේණිගත කිරීම සඳහා පදනමක් සකස් කිරීමටය. මෙසේ ශ්‍රේණිගත කරනු ලබන පුස්තකාලවලින්, දිස්ත්‍රික් පුස්තකාල සේ දියුණු කළ හැකි පුස්තකාල සේ දියුණු කළ හැකි පුස්තකාල තෝරා ගැනීමද මෙම සමීක්ෂණයේ තවත් අරමුණකි. දැන් ක්‍රියාත්මක වීමට යන දිස්ත්‍රික් සංවර්ධන මණ්ඩල ක්‍රමය යටතේ දිස්ත්‍රික් පුස්තකාල ගොඩ නැඟීම සඳහා අවශ්‍ය වාතාවරණයක් ඇති වී තිබෙන බව සඳහන් කළ යුතුයි.

මණ්ඩලය විසින් රැස් කරන ලද තොරතුරු හා සංඛ්‍යා ලේඛන පදනම් කොට ගෙන මහජන පුස්තකාල ශ්‍රේණි 3 කට බෙදා වෙන් කොට තිබේ. i, ii හා iii ශ්‍රේණි වශයෙන් කොටස් කළ මෙම පුස්තකාල ඒ ශ්‍රේණිවලට තෝරා ගනු ලැබුයේ ප්‍රධාන වශයෙන් පුස්තකාල ගොඩනැගිලි පහසුකම් හා පොත් තොගය පදනම් කර ගෙනය. එකී පුස්තකාල ස්ථිර වශයෙන් මෙම ශ්‍රේණිවලට ඇතුළත් කරන්නේද යන්න නිගමනය කිරීමට පෙර පුස්තකාල පරීක්ෂා කිරීමට මණ්ඩලය අපේක්ෂා කරයි.

එම පරීක්ෂණයේදී.

(i) පුස්තකාලයේ පිහිටීම
(ii) අදාල පළාත් පාලන ආයතනයේ ශ්‍රේණිය
(iii) මුදල් ප්‍රතිපාදන
(iv) ජනගහණය
(v) ගොඩනැගිලි පහසුකම්
(vi) සේවා පුළුල් කිරීමේ හැකියාව
(vii) ව්‍යාප්ති සේවා හා
(viii) අදාල පළාත් පාලන ආයතන කොට්ඨාශය තුළ ඇති අධ්‍යාපනික හා සංස්කෘතික සංවිධාන

ගැන අවධානය යොමු කරනු ලැබේ.

පුස්තකාල ශ්‍රේණිගත කිරීම සඳහා දැනට නිගමනය කොට ඇති ප්‍රමිති ඉතා පහත් මට්ටමක ඇති බව සඳහන් කළ යුතුය: ආරම්භයේදී මීට වඩා ඉහළ මට්ටමක ප්‍රමිති නියම කිරීම ප්‍රායෝගික නොවේ. එහෙත් අවුරුදු 8 කට පසු යළිත් මෙම ප්‍රමිති නියම කොට ඇත්තේ බොහෝ කාලයක් උසස් වීමේ ක්‍රමයක් නොමැතිව අපේක්ෂා භංගව සිටින පුස්තකාලයාධිපතින්ට සහනයක් සැපයීමේ අභිලාශයෙනි.

1979 සංඛ්‍යාලේඛන අනුව මෙම පුස්තකාල ශ්‍රේණිවලට ඇතුළත් කළ හෙයින්, දැන් තත්ත්වය පරීක්ෂා කොට නැවත ඒ ශ්‍රේණි ගැන සලකා බැලිය යුතුව ඇත.

දැනට ඇති තොරතුරු අනුව දිවයිනේ ඇති 600 ක් පමණ පුස්තකාල වලින් 10 ක් පමණක් ප්‍රථම ශ්‍රේණියට ඇතුළත් කළ හැක. 16 ක් දෙවෙනි ශ්‍රේණියටද 55 ක් 3 වැනි ශ්‍රේණියටද වර්ග කළ හැක. දෙවෙනි ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා තවත් පුස්තකාල 14ක් ගැන සැලකිල්ල යොමු වී තිබේ. මේ අනුව දිස්ත්‍රික්ක පුස්තකාල වශයෙන් සංවර්ධනය කළ හැකි පුස්තකාල 40 ක් තෝරා ගැනීමට හැක. එසේ වුවද, ආරම්භයේ දිස්ත්‍රික් පුස්තකාල තත්ත්වයට නම් කළ හැක්කේ 1 ශ්‍රේණියේ පුස්තකාල 10 ක් පමණයි. අවශ්‍ය පමණ 1 වැනි ශ්‍රේණියේ පුස්තකාල සංඛ්‍යාවක් නොමැති හෙයින් තාවකාලිකව 2 ශ්‍රේණියේ පුස්තකාල දිස්ත්‍රික් පුස්තකාල ලෙස නම් කිරීමට සිදු වේ.

## සංවර්ධන වැඩ පිළිවෙල

ශ්‍රී ලංකාවේ එක්කෝටි හතලිස් පන් ලක්ෂයකට අධික ජනගහනයෙන් වැඩි කොටසක් වාසය කරන්නේ ගම්බදවය. දිවයිනේ මුළු බිම් ප්‍රමාණය වන වර්ග සැතපුම් 25,000 න්, බටහිර ප්‍රදේශයේ ජනගහණය ඉතා ඝනව වැඩි ඇත. කෙසේ වුවද සාමාන්‍යයෙන් වර්ග සැතපුමකට මිනිසුන් 504 ක ජනගහණයක් ලංකාවේ ඇති හෙයින් බොහෝ පළාත් පාලන ආයතන කොට්ඨාශවල විශාල ජනගහණයක් ඇති බව පෙනේ.

ලංකාවේ මුළු ජනගහනයෙන් සියයට 77.67 ක් ගම්බද වාසය කරන බව නිගමනය කොට ඇත.

දිස්ත්‍රික් පුස්තකාල ක්‍රමය සැලසුම් කිරීමේදී මෙම ජනගහන රටාව අනුගමනය කර ඇත.

සංවර්ධන යෝජනා ක්‍රමයෙහි විශේෂයෙන් අප විසින් සලකා බලනු ඇත්තේ පුස්තකාලයට අවශ්‍ය

1. ගොඩනැගිලි පහසුකම්
2. පොත් තොගය
3. ළී බඩු හා උපකරණ
4. කාර්ය මණ්ඩලය
5. සේවා හා මුදල් ප්‍රතිපාදන
දියුණු කිරීමය.

ඉහත සඳහන් අවශ්‍යතා සපුරා දිස්ත්‍රික්ක පුස්තකාලවල තත්ත්වය උසස් කිරීමට හැකි හැම උත්සාහයක්ම ගැනීම පළාත් පාලන ආයතනවල ප්‍රධානීන් සභාපතිවරු, නගරාධිපතිවරු සහ කාර කොමසාරිස්වරු විසින් දක්වන උනන්දුව සහ උපකාරය මතයි මෙම ව්‍යාපාරය සාර්ථක කර ගත හැක්කේ. ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් වෘත්තීමය වශයෙන් අවශ්‍ය සියළු ආධාර හා උපකාර සපයනු ඇත. විශේෂයෙන් පහත සඳහන් අංශ සම්බන්ධයෙන් මණ්ඩලයේ සහාය පළාත් පාලන ආයතනවලට අවශ්‍ය වනු ඇත.

1. කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා පාඨමාලා, සම්මන්ත්‍රණ ආදිය පැවැත්වීම.
2. පුස්තකාල පාලනය/ සංවිධානය පිළිබඳ වෘත්තීමය ලිපිලේඛන, තෝරාගත් පොත්ලැයිස්තු පිළියෙල කිරීම පුස්තකාල භාණ්ඩ හා උපකරණ සම්බන්ධයෙන් ප්‍රමිති, වෙනත් වෘත්තීමය තොරතුරු.

6 වන පිටුවට . . .



● දිස්ත්‍රික් පුස්තකාල සම්මන්ත්‍රණයේදී මහජන පුස්තකාල පණතක අවශ්‍යතාවය පිළිබඳව පුස්තකල සේවා මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂ එස්. එම්. කමල්දීන් මහතා කරුණු ඉදිරිපත් කළ අවස්ථාව.

# දිස්ත්‍රික් පුස්තකාල...

(6 වන පිටුවෙන් ඉතිරි)

3. ගොඩනැගිලි, සේවා අංශ සංවිධානය, උපකරණ ලිබඩු භාවිතය පිළිබඳ උපදෙස්, කාර්‍ය මණ්ඩලය පිළිබඳ පරිපාලනමය වෘත්තීය උපදෙස්, පොත් තොගය ගොඩනගා ගැනීම, ව්‍යාප්ති සේවා සංවිධානය කිරීම පුස්තකාල සහයෝගිතා වැඩ පිළිවෙල සකස් කිරීම පුස්තකාල සහයෝගිතා වැඩ පිළිවෙල සකස් කිරීම හා මහජන සම්බන්ධතා සම්බන්ධයෙන් උපදෙස් හා උපකාර සැපයීම.

මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලබන පිළිවෙලට දිස්ත්‍රික් පුස්තකාල සංවර්ධනය කිරීමෙන් පසු එම පුස්තකාල පිහිටා ඇති ප්‍රදේශවල මහජනතාවට මෙන්ම දිස්ත්‍රික්කය පුරාම සේවා රැසක් ඉටු කිරීමට සමත්වනවා ඇත.

පුස්තකාලය අයත් පළාත් පාලන ආයතන කොට්ඨාශයකට අයිති ප්‍රදේශයෙහි පහත සඳහන් සේවා සැපයීම දිස්ත්‍රික්ක පුස්තකාලයකට කළ හැක.

1. විමර්ශණ පුස්තකාල පහසුකම්
2. ප්‍රාදේශීය ඉතිහාසය හා තොරතුරු රැස් කිරීම
3. පාඨක නිවෙස්වලට කියවීමේ පහසුකම් ලබා දීම
4. කියවීම් ශාලා ඇති කිරීම
5. ළමා පුස්තකාල සේවා
6. ශාරීරික දුබලතාවයන්ගෙන් පෙළෙන අය සඳහා පුස්තකාල පහසුකම් ඇති කිරීම
7. ශ්‍රව්‍ය / දෘශ්‍ය සේවා (ගුවන් විදුලිය, රූපවාහිනිය, කැසට් පටි, චිත්‍රපටි යනාදිය)
8. ව්‍යාප්ති සේවා.

පළාතේ ඇති කුඩා පුස්තකාලවලටද ආධාර උපකාර සැපයීමෙන්ද එම පුස්තකාලවල කටයුතු හා ප්‍රධාන පුස්තකාලයේ කටයුතු ඒකාබද්ධ කිරීමෙන්ද දිස්ත්‍රික් පුස්තකාලය අදාල ප්‍රදේශයේ පුස්තකාල සේවා පිළිබඳ නායකත්වය ගෙන කටයුතු කිරීමට හැකි වනවා ඇත. එවිට දිස්ත්‍රික් පුස්තකාලය කුඩා පුස්තකාලවලට ආදර්ශයක් වනු ඇත.

ඇතැම් දිස්ත්‍රික්කවල ජනගහණය ඉතාමත් විශාල හෙයින් එක් දිස්ත්‍රික් පුස්තකාලයක් පමණක් ප්‍රමාණවත් නොවන්නට පුළුවනි. අනික් අතින් ප්‍රමාණවත් පුස්තකාල පහසුකම් නොමැති දිස්ත්‍රික්කවල දැනට ඇති පුස්තකාල වැඩි දියුණු කොට දිස්ත්‍රික් මට්ටමේ පුස්තකාල තත්ත්වයකට ගෙන ආ යුතුයි. ජාතික මට්ටමේ පුස්තකාල සේවයක් සඳහා සෑම දිස්ත්‍රික්කයකම සමාන තත්වයටක දියුණු වූ පුස්තකාල තිබීම අවශ්‍යතාවයක්.

දිස්ත්‍රික් පුස්තකාලයක් විසින් දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රදේශවලට පහත සඳහන් සේවා සැපයීම අවශ්‍යයි.

1. ජංගම පුස්තකාල සේවය;

ගම්බදව ඇති කුඩා පුස්තකාලවල ඇත්තේ ඉතා සුළු ප්‍රමාණයක පොත්පත් හෙයින් ජංගම පුස්තකාල සේවයක් මගින් එම පුස්තකාලවල පොත් තොගය ශක්තිමත් කර ගත හැක. කුඩා පුස්තකාල සියල්ලම දිස්ත්‍රික් පුස්තකාලයේ ශාඛා පුස්තකාල වශයෙන් සංවිධාන කිරීම අවශ්‍ය වනවා. එසේ කිරීමෙන් දිස්ත්‍රික් පුස්තකාලයේ පොත් බැංකුවක ඇති පොත්පත් වරින් වර කොටස් වශයෙන් කුඩා පුස්තකාල පාවිච්චියට දීමටත් එමගින් අළුත් පොත් නොකඩවා පාඨකයින්ට ලබා දීමටත් හැකිවනවා. එපමණක් විවිධ විෂයයන් හා ක්ෂේත්‍ර පිළිබඳ පොත් රාශියක්ද ලබා දීමට අවස්ථාව ලැබෙනවා. දිස්ත්‍රික් පුස්තකාල තොග වෙළඳ ආයාතනයක් මෙන්ද කුඩා පුස්තකාල සිල්ලර වෙළඳ ආයතනයක් මෙන්ද කටයුතු කරන්නට පුළුවන්.

මේ සම්බන්ධයෙන්' දැනට මත් පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන් විසින් සිය ප්‍රදේශවල කුඩා පුස්තකාලයන් මගින් පොත් පිරුළට දීමේ ක්‍රමයක් ආරම්භ කොට ඇති බව සතුටින් සඳහන් කළ යුතුය. ඒ මගින් කුඩා පුස්තකාලවල සීමිත පොත් සම්පත් සෑහෙන ප්‍රමාණයකට දියුණු වන බව කිවයුතුය. මේ පරමාර්ථය ඇතිව පුස්තකාල සේවා මණ්ඩලය විසින්ද පොත් පෙට්ටි මගින් කුඩා පුස්තකාලවලට අළුත් පොත් ලබා ගැනීමේ ක්‍රමයක් සංවිධානය කොට ඇත. මෙවායින් ලැබෙන ප්‍රයෝජන සීමිතය. වඩා හොඳ සේවයක් සැපයිය හැක්කේ දිස්ත්‍රික් පුස්තකාල මගිනි. ඒ සඳහා රථවාහන පහසුකම්ද දිස්ත්‍රික් පුස්තකාලවලට ලබාදිය යුතුය.

2. පුස්තකාල කාර්‍ය මණ්ඩලය සඳහා සේවාස්ථ පුහුණුව;

දිස්ත්‍රික් පුස්තකාලය භාරව කටයුතු කරන පුස්තකාලයාධිපතිවරයා වෘත්තීය සුදුසුකම් ලත් පුහුණු නිලධාරියෙකු හෙයින් දිස්ත්‍රික්කයේ කුඩා පුස්තකාලවලට අවශ්‍ය කාර්‍ය මණ්ඩලය පුහුණු කිරීම දිස්ත්‍රික් පුස්තකාලයාධිපතිට ඉටු කළ හැකිය: දැනට එවැනි සේවාස්ථ පුහුණුවීමේ පහසුකම් ඇත්තේ කොළඹ ඇති පුස්තකාල එක දෙකක පමණක් හෙයින් විධිමත් අඛණ්ඩ සේවාස්ථ පුහුණු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම අපහසු වී තිබේ. විශේෂයෙන් දුර බැහැර ඇති පුස්තකාල කාර්‍ය මණ්ඩලයට කොළඹට පැමිණීම දුෂ්කරය.

3. මධ්‍යගත ග්‍රන්ථ පරිග්‍රහණය, සූචිකරණය හා භාවිතයට ග්‍රන්ථ සකස් කිරීම:

කුඩා පුස්තකාලවලට මුහුණ පෑමට සිදුවී ඇති අතිමහත් දුෂ්කරතාවයක් වනුයේ පොත් තේරීම, සූචිගත කිරීම, වර්ගීකරණය කිරීම යනාදිය සඳහා අවශ්‍ය ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ලබා ගැනීමේ අපහසුතාවය හා එම කාර්‍යයන් සඳහා අවශ්‍ය පුහුණු පුස්තකාල කාර්‍ය මණ්ඩලයක් නොමැති වීමය. මීට ඉතාම සුදුසු පිළියම වන්නේ එවැනි කාර්‍ය මණ්ඩලයක් ඇති දිස්ත්‍රික් පුස්තකාලයෙන් මෙම කාර්‍යයන් මධ්‍යගත සේවා වශයෙන් ඉටු කිරීමය. එවිට හැම පුස්තකාලයටම එකාස් සුදුසුකම් ලත් කාර්‍ය මණ්ඩලයක් හෝ මෙවලම් අවශ්‍ය නොවේ. තවද, එවැනි මධ්‍යස්ථානයකින් මෙකී කාර්‍යයන් කිරීමෙන් එම කටයුතුවල සේවා තත්වය ඉහළ මට්ටමකින් පවත්වා ගත හැකිය. දිස්ත්‍රික්කය කරා මෙම කාර්‍යයන්ගේ ඒකරූපතාවයක්ද ඇති වන්නේය. පුස්තකාල මණ්ඩලයට මෙම කටයුත්ත සංවිධානය කර දිය හැක.

4. පොත් බැඳීමේ මධ්‍ය කාර්‍යාංශ;

සිංහල හා දෙමළ මාධ්‍යයෙන් නිකුත් වන පොත්වල නිෂ්පාදන තත්ත්වය ඉතා අසතුටුදායක බව නොරහසකි. මෙම පොත් පුස්තකාලවල ප්‍රයෝජනයට යෙදීමට පෙර බැඳීම අවශ්‍යය. නමුත් ඒසා විශාල පොත් තොගයක් බැඳීමට විශාල මුදලක් වැය විය යුතු හෙයින් කුඩා පුස්තකාලවලට එය නොකළ හැක්කකි. නමුත් දිස්ත්‍රික් පුස්තකාලයක පොත් බැඳීමේ අංශයක් ඇති කොට දිස්ත්‍රික්කයේ සියළු පුස්තකාලවලට පොත් බැඳීමේ මධ්‍යගත සේවයක් ආරම්භ කළ හැක. ඇතැම් විට සෑහෙන ලාභයක් ලැබෙන පරිදි මෙම සංවිධානය කර ගතහොත් ඊට අවශ්‍ය කාර්‍ය මණ්ඩලයට වේතනය ගෙවීමද එම ලාභ වලින්ම පියවාගත හැක. පුස්තකාලයේ මුදල් මේ සඳහා වැය කිරීම එවිට අනවශ්‍යය.

5. මධ්‍ය විමර්ශණ සේවා;

විමර්ශණ සේවා දිස්ත්‍රික්කය තුළ මෙන්ම දිස්ත්‍රික්කයෙන් බාහිරවද සැපයීම දිස්ත්‍රික්ක පුස්තකාලයක වැදගත් කාර්‍යයක් වේ. මේ සම්බන්ධයෙන් ජාතික පුස්තකාල මණ්ඩලයේ කාර්‍ය භාරය ගැන මතක් කිරීම කාලෝචිතය.

ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අරමුණ වන්නේ පුස්තකාල සේවා පද්ධතියක් ඇති කිරීමය. අනාගතයේදී පුස්තකාල සේවා සැලසුම් කළ යුත්තේ එම අරමුණ ඇතිවය. ජාතික පුස්තකාල සේවයක් ඇති කිරීමෙන් පුස්තකාල පාලනය කිරීම අදහස් නොකෙරේ' එයින් අදහස් කෙරෙන්නේ කිසිම සම්බන්ධතාවයක් නොමැතිව' එකාබද්ධතාවයක් නොමැතිව දස අතේ විසිරී ඇති පුස්තකාල සම්පත් හා සේවාවන් සම්බන්ධීකරණය කොට, එහි ශක්තියෙන් ජාතික වශයෙන් හෝ අන්තර් ජාතික වශයෙන් පාඨකයෙකුට හෝ පුස්තකාලයට ලබා දිය හැකි උපරිම ප්‍රයෝජනය ලබා දීමය.

ප්‍රායෝගික වශයෙන් සලකන විට මෙයින් අදහස් කරන්නේ කුඩා ගැමි පුස්තකාල නගරබද විශාල පුස්තකාලවලට සම්බන්ධ වන අතර නාගරික පුස්තකාල දිස්ත්‍රික් පුස්තකාලවලට සම්බන්ධ කිරීමය.

දිස්ත්‍රික්ක පුස්තකාල ජාතික පුස්තකාලයට සම්බන්ධ වනු ඇත. ජාතික පුස්තකාලය ලෝකයේ වෙනත් රටවල ජාතික පුස්තකාලවලට සම්බන්ධ වනු ඇත. මෙසේ ලෝකයේ ඇති විශ්ව ඥානය ඔබේ අතට පත් කිරීමට හැකිය.

6. අන්තර් පුස්තකාල පොත් හුවමාරු:

යම්කිසි පුස්තකාලයක නැති පොතක් වෙනත් පුස්තකාලයකින් ඉල්ලා ගැනීම පමණක් ''අන්තර් පුස්තකාල පොත් හුවමාරු'' යන්නෙන් අදහස් නොකෙරේ. එයින් අදහස් කරන්නේ රටේ ඇති ඕනෑම පුස්තකාලයකින් එසේ නැතහොත් විදේශ පුස්තකාලයකින් වුවත් පාඨකයෙකුට පොත් ලබා ගැනීමේ ක්‍රමයකි. දිස්ත්‍රික්කය තුළ මෙන්ම විවිධ දිස්ත්‍රික්ක අතර පොත් හුවමාරු දිස්ත්‍රික්ක පුස්තකාලයට කළ හැක. රටේ ඇති සියළුම පුස්තකාල එවැනි වැඩ පිළිවෙළකට සහයෝගය දක් වූවහොත් එය මුළු රටම එක් පුස්තකාලයක් වූවා හා සමානය.

7. ශ්‍රව්‍ය-දෘශ්‍ය සේවා හා පිරුළු සේවාව:

මිළ වැඩිකම නිසා ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයෙන් නිකුත් වී ඇති පාඨක ද්‍රව්‍ය ලංකාවේ මහජන පුස්තකාලවල ඇත්තේම නැතැයි කිව හැක. ඒ නිසා පුස්තකාලවලට ලබා ගනු ලබන්නේ පොත් පමණය. නමුත් මෑතකදී සිට පුස්තකාල තම පාඨකයින් සඳහා විදේශීය තානාපති කාර්යාල හා වෙනත් ආයතන වලින් චිත්‍රපට, සේයාතහඩු, ටේප් වැනි ද්‍රව්‍ය හා උපකරණ ඉල්ලා ගැනීමට පටන් ගෙන තිබේ. මේ තත්වය යටතේ යටත් පිරිසෙයින් දිස්ත්‍රික්ක මහජන පුස්තකාලයේවත් මෙම ද්‍රව්‍ය එකතුවක් ගොඩනැගීමෙන් කුඩා පුස්තකාල වලට මහත්' සෙතක් සිදුවේ.

8. පාසැල් පුස්තකාලවලට සේවා සැපයීම;

පාසැල්වලට අවශ්‍ය පුස්තකාල පහසුකම් සැපයීම අධ්‍යාපන අමාත්‍යාංශයට මුහුණ පෑමට ඇති බලවත් ප්‍රශ්ණයකි. මණ්ඩලය විසින් මෑතකදී පාසැල් පුස්තකාල පිළිබඳ, කරන ලද සමීක්ෂණයකදී හෙළිවූ පරිදි පාසැල් 10,000 කින් පුස්තකාල ඇත්තේ 750 ක පමණයි. එහෙයින් පාසැල් ශිෂ්‍යයින්ගේ පුස්තකාල අවශ්‍යතා සපුරාලීමේදී මහජන පුස්තකාලවලට මහත් වගකීමක් අයත් වෙනවා. දැනටමත් මහජන පුස්තකාල පාවිච්චි කරන අයගෙන් වැඩි දෙනෙක් පාසැල් සිසුන් බව අපි දන්නවා.

පාසැල්වල පුස්තකාල නොමැති අවස්ථාවලදී ජංගම සේවා මගින් පාසැල්වලට පොත් සේවයක් ඇරඹීම කිරීමට දිස්ත්‍රික් පුස්තකාල උත්සාහ සළ යුතුයි. විවෘත විශ්ව විද්‍යාලය ආරම්භ වී ඇති මෙම අවස්ථාවේ මහජන පුස්තකාල වලට විශ්ව විශ්ව විද්‍යාල සිසුන්ගේ පොත්පත් අවශ්‍යතාවන්ද සපුරාලීමට සිදුවේ.

විශේෂයෙන් දිස්ත්‍රික් පුස්තකාල මෙම සේවා ගැන අවධාරනය යොමු කළ යුතුවේ.

9. විශේෂ එකතුන්;

දිස්ත්‍රික් පුස්තකාල දියුණු වීගෙන යන විට ක්‍රමයෙන් එක් එක් විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සියළු පොත්පත් රැස් කිරීමට කටයුතු කිරීම ප්‍රඥගොචරය. එසේ විෂයයන් තෝරා ගැනීමේදී වෙනත් දිස්ත්‍රික්ක පුස්තකාල සමඟ සාකච්ඡා කොට එම විෂයයන් බෙහෝ ගණනක් එසේ පුස්තකාල අතර බෙදා ගත හැක. මෙම ක්‍රමය එක්සත් රාජධානියේ ඉතා සාර්ථක ලෙසක්‍රියාත්මක වේ.

ජාතික මට්ටමේ හොඳ පුස්තකාල සේවයක් සඳහා මහජන පුස්තකාල අතර සාර්ථක සම්බන්ධතාවයක් හා සහයෝගයක් තිබිය යුතු බව දිස්ත්‍රික් පුස්තකාල සම්බන්ධයෙන් ඉහතින් දක්වූ කරුණුවලින් මනාව පැහැදිලි වේ.

මෙම ව්‍යාපාරයේදී ජාතික පුස්තකාල සේවා මණ්ඩල විසින් ඉටු විය යුතු කාර්‍යභාරයද පැහැදිලිය. යෝජිත පුස්තකාල සේවා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී හැම අවස්ථාවේම පුස්තකාල සේවා මණ්ඩලයේ මඟ පෙන්වීම හා උපදෙස් අවශ්‍ය වනු නොඅනුමානය. මෙහිදී විශේෂයෙන් අවධාරනය කළ යුත්තේ මණ්ඩලයේ කාර්‍යයන් උපදෙස් හා උපකාර සැපයීමට පමණක් සීමා විය යුතුය යන්නය. ක්‍රමවත් ප්‍රයෝජනවත් පුස්තකාල සේවයක් ගොඩනැගීමේ වගකීම සම්පූර්ණයෙන්ම දිස්ත්‍රික් පුස්තකාලය සතු විය යුතුය.

දිස්ත්‍රික් පුස්තකාලයක කටයුතු කෙටියෙන් මෙසේ දැක්විය හැක;

(1) ග්‍රාමීය මට්ටමෙන්
(අ) විමර්ශණ සේවා
(ආ) ප්‍රාදේශික ඉතිහාසය

(7 වන පිටුව බලන්න)

# යුනෙස්කෝ තැන්පතු පුස්තකාල ක්‍රමය

**යුනෙස්කෝ තැන්පතු පුස්තකාල ක්‍රමය යටතේ එහි ශ්‍රී ලංකා ශාඛාව වශයෙන් ක්‍රියා කරනුයේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයයි. යුනෙස්කෝව මගින් ප්‍රකාශිත වන සෑම ප්‍රකාශනයක්ම මෙම වැඩ පිළිවෙල යටතේ පුස්තකාල සේවා මණ්ඩලයට ලැබේ.**

මෙම තැන්පතු පුස්තකාල ක්‍රමය යුනෙස්කෝව විසින් ආරම්භ කරන ලද්දේ 1949 ජනවාරි මසදීය. එහි පරමාර්ථය වූයේ යුනෙස්කෝ සාමාජික රාජ්‍ය හැමෙකක්ම පාහේ අඩුම තරමින් එකම පුස්තකාලයකවත් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සහ එහි කාර්යයන් හකුළුවා දක්වමින් නිකුත් කරන සිය ළු ප්‍රකාශන, වාර සඟරා සහ ලේඛන විශේෂඥයන් විසින් පමණක් නොව, මහජනතාව උදෙසාද විමසා බැලීම පිණිස තැන්පත් කර තැබීමයි.

මෙම තැන්පතු පුස්තකාල ක්‍රමයෙන් අදහස් කරන ලද තවත් කරුණක් නම්, යුනෙස්කෝ ප්‍රකාශන පිළිබඳ ඒජන්තවරුන් මාර්ගයෙන් කරනු ලබන සාමාන්‍ය බෙදා හැරීම එමෙන් නිල මට්ටමින් කරනු ලබන යුනෙස්කෝ ජාතික කොමිසම වෙත යොමු කළ බෙදා හැරීම, යුනෙස්කෝ වැඩ සටහන් හා සහයෝගීව ක්‍රියා කරන ආයතන හා විශේෂඥයන් වෙත කරනු ලබන නොමිලේ බෙදා හැරීම යන ආදියේ ඌනපූර්ණයයි.

යුනෙස්කෝ ප්‍රකාශන සඳහා නියෝජනයක් දරන පුස්තකාලයක් පත් කිරීමේ උපමානයට හේතු වූයේ යුනෙස්කෝ ජාතික කොමිසම විසින් ඉල්වා සිටින ලද පහත සඳහන් කරුණු හේතු වෙනි;

(i) එකී පුස්තකාල අවශ්‍යයෙන්ම පිහිටා තිබිය යුත්තේ ජාතික, ප්‍රාදේශීය නැතහොත් පළාත් බද එසේත් නැතහොත් වැදගත්කමින් හෙබි නගරයකයි.

(ii) විශේෂ අවස්ථාවලදී බලය පැවරීමකදී මිස, කිසියම් නගරයක තිබිය හැක්කේ එක් තැන්පතු පුස්තකාලයක් පමණි.

(iii) පුස්තකාලය සියල්ලන් සඳහා විවෘතව තිබිය යුතුය. ඒ කියන්නේ ප්‍රකාශනවලින් අත් කර ගත හැකි ලාභය විෂයෙහි සීමාවන් නොතිබිය යුතුය. (මෙ හේතුව නිසාවෙන් පාර්ලිමේන්තු නැතහොත් උගතුන්ට පමණක් සීමා වූ පුස්තකාල විශේෂ තැන්පතු වශයෙන් පමණක් යෝජිතය.)

(iv) මෙම තැන්පතු ක්‍රමය යටතේ යුනෙස්කෝ ප්‍රකාශන එම පුස්තකාලයට ලියා පදිංචි කිරීමට, සූචිකරණයට, ප්‍රදර්ශණයට සහ බැහැර දීමට අත්‍යවශ්‍ය පහසුකම් (එය පිහිටි ස්ථානයේදී මෙන්ම, හැකියාව අනුව තැපැල් මගින් වුවද) තිබිය යුතුය.

(v) තෝරා ගනු ලබන පුස්තකාල සාමාන්‍ය පුස්තකාල විය යුතු අතර, විශේෂ පුස්තකාලයක් නොවිය යුතුය. (විද්‍යාත්මක හා තාක්ෂණික පුස්තකාලයක්, කෞතුකාගාර පුස්තකාලයක්, ශික්ෂණ ශාස්ත්‍රය නැතහොත් අධ්‍යාපන ප්‍රලේඛන මධ්‍යස්ථානයක් ආදී වශයෙන් වන පුස්තකාල මින් අදහස් කැරේ) මෙය යුනෙස්කෝ වැඩ සටහන් ක්‍රියාකාරිත්වය මගින් හසුකර ගන්නා පුළුල් ක්ෂේත්‍රය හේතුවෙන් මෙය මෙසේ විය යුතු යැයි අදහස් කෙරේ.

තැන්පතු පුස්තකාල සංඛ්‍යාව එකිනෙක රටෙහි විවිධ වන්නේ රටෙහි භූමි ප්‍රමාණය අනුවය. දැනට මේ ගණයේ තැන්පතු පුස්තකාල 322 ක් වෙයි. මේවා පහත දැක්වෙන කණ්ඩායම් වලට බෙදිය හැක්කේ ඒවාට ලැබෙන ද්‍රව්‍ය අනුවය.

- O ප්‍රකාශන, වාර සඟරා සහ ලේඛන ආදියෙන් නිති පතා එක් පිටපතකට වැඩියෙන් ලැබෙන පුස්තකාල (18)
- O සියලුම ප්‍රකාශන වාර සඟරා සහ ලේඛන එක් පිටපත බැගින් ලැබෙන පුස්තකාල ( 139 )
- O ප්‍රකාශන සහ වාර සඟරා පමණක් ලැබෙන, එනමුත් ලේඛන, නොලැබෙන පුස්තකාල (115)
- O වාර සඟරා පමණක් ලැබෙන පුස්තකාල (11)
- O Unesco Bulletin for. Libraries නමැති ප්‍රකාශනය (දැන් මෙය Unesco journal of information science, Librarianship and archives administration පළ වේ.) සහ නොමිලේ බෙදා හරිනා ප්‍රකාශන ලැබෙන පුස්තකාල

1949 දී තැන්පතු පුස්තකාල කොමිටියක් පත් කරන්නට යෙදුනේ තැන්පතු පුස්තකාල පත් කිරීම උදෙසා අවසාන උපමාන තහවුරු කිරීම පිණිස සහ එම වැඩ පිළිවෙළෙහි සාමාන්‍ය ක්‍රියාකාරිත්වය මෙන්ම, පුස්තකාල පත් කිරීම උදෙසා ලැබෙන ඉල්ලීම් සලකා බැලීම පිණිසත්ය.

යුනෙස්කෝ ප්‍රකාශන මණ්ඩලයේ යෝජනාවක් අනුව අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් නව තැන්පතු පුස්තකාල කොමිටියක් පත් කිරීමට තීරණය කර ඇත. මෙම කොමිටිය විසින් දැනට පවත්නා තැන්පතු පුස්තකාල පත් කිරීමේ උපමානයන් (ප්‍රමිති) නැවත පරීක්ෂා කරනු ඇත. එමගින් දැනට පවත්නා සියළු තැන්පතු පුස්තකාල පිළිබඳව සහ ඒවායින් සලසන සේවා පිළිබඳව සමීක්ෂණයක් කරනු ඇත. මෙම පුස්තකාලයන්හි කාර්යක්ෂම වර්ධනය සඳහා මෙම ක්‍රමය පිළිබඳ තක්සේරුවක්ද කරනු ඇත.

මෙම තැන්පතු පුස්තකාල පිළිබඳ ලේඛනයක් යුනෙස්කෝ මූලස්ථානයෙහි ඇති අතර, එම ලැයිස්තුව ඉල්වා යැවීමෙන් ලබා ගත හැකිය.

● පියසේන වික්‍රමගේ

# ශ්‍රී ලංකාවට ජාතික පුස්තකාලයක් . . .

[2 පිටුවෙන් ඉතිරි]

කරුණක් වනුයේ එය පාඨකයාට ලබා ගත හැකිවීමයි. අනාගතයේ ඕනෑම වර්ගයක පාඨකයකුට, ඔහුට එම තොරතුරු අවශ්‍ය යැයි තීරණය කරන ඕනෑම අවස්ථාවක ලබා ගත හැකි වන අතර, එය නිරන්තරයෙන්ම එහි තිබේ. ඔහුට මූලාශ්‍රයන් පරීක්ෂා කළ හැක. ඒවා පසු කාලයේදී තර්ක විතර්ක ආදිය සඳහා යොදා ගත හැක. ඒ අනුව මේවායේ තිබෙන්නේ මොනවා දැයි සොයා බලා ගෙන, කලින් ඉදිරිපත් කරන ලද අදහස් විවේචනයට භාජනය කිරීම ඔහු සතු කාර්යයකි.

මෙහිදී, මම ඉදිරිපත් කරන ලද අදහස් විවේචනයට භාජනය කිරීම ඔහු සතු කාර්යයකි. කෙසේ වෙතත් මම ඉදිරිපත් කරන අදහස වැදගත්ද, නොවැදගත්ද කියා තීරණය කිරීමේදී මම දැන් ඉදිරිපත් කළ අදහසට එරෙහිව අදහස් ඉදිරිපත් කිරීම ඔබට ඉතාමත් අපහසු වනු ඇත. තොරතුරු සම්පත් අප කිසිවකු නොදන්නා අනාගතය උදෙසා එකතු කොට තබා, ලබා දිය යුතු වීම, ඉතාම වැදගත් වන අතර සංවර්ධනය වන රටවල් සම්බන්ධයෙන් එහි වැදගත් කම ඉතාමත් වැඩිවේ. ඒවා යොදා ගන්නේ කුමන ආකාරයටද ඒවා සමඟ කුමක් කරනවාද යන්න අපා අනාගතයේදී තීරණය කරනු ලබනු ඇත. මම ඉදිරිපත් කළ ලීමට උත්සාහ කළ අදහසට ඔබ දැන් එකඟ වනු ඇතැයි මම විශ්වාස කරමි.

ලංකා ජාතික පුස්තකාලය කොළඹ පිහිටු වන්නේ ඇයිද යන්න තවදුරටත් සාකච්ඡාවට භාජනය වන කරුණක් විය හැක. කොතෙක් සාකච්ඡා පැවතුනත්, 'ජාතික පුස්තකාලය'' ගොඩ නැඟීම සාර්ථක අවසානයකට ළඟා වනු ඇතැයි මම විශ්වාස කරමි. ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය වෙනුවෙන් මෙවැනි පුස්තකාලයක් සැලසුම් කරලීමෙනුත්, මෙහි සිටීමෙනුත් මම විශාල ප්‍රීතියක් සහ වින්දනයක්ලදිමි.

නමුත් වැදගත් වන කරුණ නම්, මම ප්‍රීතියක් ලැබුව ද නැද්ද යන්න නොව, අවසානයේ මෙහි ගොඩනැගිල්ලක්, වඩාත් වැදගත් ලෙස කියනවා නම් දැනුම ගබඩා කරන සහ බෙදා හරින, ක්‍රියාත්මක ආයතනයක් බිහි විය යුතු වීමයි. මේ හැම දෙයකටම වඩා වැදගත් වන දෙය නම් වර්තමානයේ අප කිසිවකු නොදන්නා ඈත අනාගතයේ මේ තොරතුරු නිරන්තරයෙන්ම සහ ප්‍රයෝජනවත් අන්දමට උපයෝගී කර ගන්නා ජනතාවක් සිටිය යුතු වීමයි.

● පරිවර්තනය; යූ. අමරසිරි

# දිස්ත්‍රික් පුස්තකාල . . . .

(6 පිටුවෙන්)

(ඇ) නිවෙස්වල කියවීම් පහසුකම් ඇති කිරීම
(ඈ) කියවීම් ශාලා පහසුකම්
(ඉ) ළමා පුස්තකාල පහසුකම්
(ඊ) ශ්‍රව්‍ය-දෘෂ්‍ය පාඨක ද්‍රව්‍ය සැපයීම
(උ) ව්‍යාප්ති සේවා සැපයීම ද

2. දිස්ත්‍රික් මට්ටමින්
(අ) ජංගම පුස්තකාල සේවා
(ආ) පුස්තකාල කාර්ය මණ්ඩලයට සේවා ස්ථ පුහුණුව
(ඇ) මධ්‍යගත ප්‍රතිග්‍රහණය සූචිකරණය, වර්ගීකරණය යනාදිය
(ඈ) පොත් බැඳීමේ මධ්‍ය සේවා
(ඉ) මධ්‍යගත විමර්ශණ සේවා
(ඊ) අන්තර් පුස්තකාල හුවමාරු සේවා
(උ) ශ්‍රව්‍ය-දෘෂ්‍ය පාඨක ද්‍රව්‍ය හා පිරුළු මධ්‍යස්ථානය
(ඌ) පාසැල් පුස්තකාල වලට සේවා සැපයීම
(එ) විෂය එකතු ගොඩ නැගීම

ජාතික පුස්තකාල සේවයක දිස්ත්‍රික්ක මට්ටමේ පුස්තකාල වලින් ඉටු විය යුතු ඉතා වැදගත් කාර්යයන් මෙහි ඉහත සඳහන් කරන ලදී. මෙය ක්‍රියාත්මක වීම සඳහා දිස්ත්‍රික් සංවර්ධන මණ්ඩල විසින් අවශ්‍ය පරිපාලනය කටයුතු හා මුදල් සම්පාදනය කළ යුතුය. එසේ වුවහොත් කාර්යක්ෂම ජාතික පුස්තකාල සේවාවක් වශයෙන් මහජන පුස්තකාල සංවර්ධනය ගැන සැකයක් නැත.

# පුස්තකාල ප්‍රවෘත්ති

● LIBRARY NEWS ● நூலகச் செய்தி


# LIBRARY LEGISLATION LONG OVERDUE !

**The urgent need for library legislation as a prerequisite for the implementation of any effective programme of library development was stressed at a Seminar and Workshop attended by District Public Librarians and administrators at the S. L. F. I. from 9th to 19th March 1981.**

The Seminar & Workshop which was inaugurated by the Minister of Education Services Mr. Lionel Jayatilake was organized by the C. N. L. S. B. with the cooperation of the Asia Foundation as a prelude to the District Library Development Project of the Board which also provides for the grading of libraries of all local authorities.

The provision of public library service by local authorities is at present a "premissive" function and does not therefore provide the base for a worthwhile library service. In view of the paramount importance of a public Libraries Act to regulate and promote the development of an integrated public library service at national level the following resolution was unanimously adopted by the participants of the seminar and Workshop.

This seminar of District Library Administrators & Librarians held at the S. L. F. I. on 09.03.1981 resolved unanimously to recommend to the Hon. Minister of Local Govt. to enact legislation to make the establishment of public library services a mandatory function of all Local Govt. Bodies, including the Disirict Development Councils. (At present this is a permissive function only) It was also decided to recommend that such service should be developed in such a way under Local Govt. Law to result in an integrated public library service for the whole country under the aegis of the National Library Services Board.

It was also urged that the C. N. L. S. B. should play an effective role in providing leadership for the public library service and act as the coordinating agency for the public libraries both at the national and international levels.

The present Public Libraries Act in the UK was enacted in 1850 and the Madras Public Libraries Act was passed only in 1945.

## AN INDEX TO MAPS OF SRI LANKA

An index to maps of Sri Lanka in the State General Archives in the Hague, Netherlands is under compilation. The list classified under area names contains 302 references to maps prepared between 1796 and 1638. The compiler of the index is K. D. Paranavitana, Assistant Archivist, Presidential Archives, Colombo 1. Sri Lanka.

## ● Presentation of Col. Olcott's Autobiography to the National Library



Copies of Colonel Henry Steele Olcott's 6 - volume autobiography. "Old Diary Leaves" were presented recently to the Sri Lanka National Library Services Board by the U. S. Embassy, Colombo in Connection with the Olcott Commemoration Day. In the picture are (left to right) Assistant Director Library Services Board, Mr. S. M. Kamaldeen, Deputy Chief of Mission, U. S. Embassy, Mr. Harry A. Cahill, Chairman Library Services Board Mr. M. J. Perera, Director (S. L. N. L. S. B) Mr. N. Amarasinghe and Assitant Director Mr. Upali Amarasiri. This book deals with most of Col. Olcott's life, including the years spent in Sri Lanka.

## තවමත් පුස්තකාල සේවාව.....

[1 වන පිටුවෙන්]

දිස්ත්‍රික් පුස්තකාල පාලකවරුන්ගේ සම්මන්ත්‍රණයේදී මහජන පුස්තකාල සේවාව දිස්ත්‍රික් සංවර්ධන සභා ඇතුලු සියළුම පළාත් පාලන ආයතන වල අත්‍යාවශ්‍ය සේවාවක් කරලීම සඳහා ගරු පළාත් පාලන ඇමතිතුමා ව්‍යවස්ථා සම්පාදනය කළ යුතුය.'' යන යෝජනාව ඒකච්ඡන්දයෙන් සම්මත විය. (දැනට එය ඉටුකළ හැකි සේවාවක් පමණි)

''ජාතික පුස්තකාල සේවා මණ්ඩලය යටතේ මුළු රටම සඳහා එකට බැඳුණු, මහජන පුස්තකාල සේවාවක් ඇති වන අන්දමට පළාත් පාලන නීතිය යටතේ මෙම සේවාවත් වර්ධනය කළ යුතු බවටත් නිර්දේශ කරලීමට'' එහිදී තීරණය විය.

මේ පිළිබඳව සම්මන්ත්‍රණයේදී හුවා දක්වන ලද තවත් වැදගත් කරුණක් වූයේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය වඩාත් කාර්ය සාඵල්‍යයෙන් යුතුව මහජන පුස්තකාල කටයුතු උදෙසා නායකත්වය දියයුතු බවයි. එමෙන් ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් මහජන පුස්තකාල උදෙසා සම්බන්ධීකරණ නියෝජිතායතනයක් වශයෙන් ක්‍රියා කළ යුතු බවද දක්වා ලිමයි.

සම්මන්ත්‍රණය අමතා කතා කළ අධ්‍යාපන සේවා අමාත්‍ය ලයනල් ජයතිලක මැතිතුමා විසින් පාසැල් පිරිවෙන් විශ්ව විද්‍යාල ආදී අධ්‍යාපනික ආයතන මගින් සිසුන්ගේ දැනුම උදෙසා ප්‍රාථමික අධ්‍යාපන අවශ්‍යතා විවිධ මට්ටමින් සලසන ආකාරය පැහැදිලි කරන ලදී.

හොඳින් සංවිධානය වූ මහජන පුස්තකාල පද්ධතියක් මගින් අඛන්ඩ අධ්‍යාපනයක් උදෙසා සැලසිය හැකි සේවාව අමාත්‍යතුමා විසින් අවධාරණය කරන ලදී.

මෙම විවෘත කිරීමේ සමුළුව මුලසුන පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපති ඇම්. ජේ. පෙරේරා මහතා විසින් උසුලන ලද අතර, මෙම අවස්ථාවට ආසියා පදනමේ දේශීය නියෝජිත ප්‍රැන්ක් ඊ. ඩයින්ස්, පළාත් පාලන සේවා අධ්‍යක්ෂ බී. ලියනමාන, පළාත් පාලන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ආචාර්ය එච්. ඒ. පී. අභයවර්ධන, අධ්‍යාපන සේවා අමාත්‍යාංශයේ ලේකම් චන්ද්‍රා ද සොයිසා, ශ්‍රී ලංකා පදනමේ අධ්‍යක්ෂ ආචාර්ය ඩී. වෙසුම්පෙරුම යන මහත්වරුද සහභාගි වූහ.

ඔබ

මහජන පුස්තකාලයේ සහතික කරන ලද වාර්තා පහත ලිපිනයට යොමු කරන්න.

අධ්‍යක්ෂ,
පුස්තකාල සේවා මණ්ඩලය
නිදහස් මාවත, කොළඹ 7.
දුර: 98847

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් දෙහිවල, ගාලුපාරේ, නවමග මුද්‍රණාලයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.